**ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුල දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**(අ) අත්තිකාරම් ගෙවීම්**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර SA-52 වගුව අනුව, අත්තිකාරම් බී ගිණුමට සමාලෝචිත වර්ෂයේ මුදලින් සිදු කළ හර කිරීම් හා බැර කිරීම් පිළිවෙලින් රු.81,961,046 ක් හා රු.69,583,195 ක් වූ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශේෂ පිරික්සුම අනුව, හර හා බැර ශේෂ පිළිවෙලින් රු.81,959,795 ක් හා රු.69,348,405 ක් වූයෙන් හර හා බැර ශේෂවල පිළිවෙලින් රු.1,200 ක් හා රු.234,790 නොසැසඳීමක් පවතින බව නිරීක්ෂණය විය. | වෙනත් වැය ශීර්ෂය විසින් සිදු කර ඇති හර හා බැර කිරීම් අනුව මෙම නොසැසඳීම සිදු වී ඇති බව දක්වා ඇත. | භාණ්ඩාගාර සටහන් සමඟ ශේෂ සන්සන්දනය කර ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුක්ත ව සිට නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.215,400 ක ණය ශේෂය අත්තිකාරම් බී ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ ඇමුණුම 3.2 හි වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් ගෙන් අය විය යුතු ණය ශේෂ යටතේ දක්වා තිබුණි. | තොරතුරු කැඳවීමේ දී වැරදීමකින් මෙය සිදු වී ඇති බවත් නිවැරදි කිරීමට පියවර ගන්නා බව දන්වා ඇත. | නිවැරදි වාර්තා ඉදිරිපත් කිරීමට අදාල පාර්ශව කටයුතු කළ යුතුය. |

**1.6.2 මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**

**(අ) දේපල, පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව, 2021 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය රු.3,197,710,978 ක් වුව ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණයට ඉදිරිපත් කල තොරතුරු අනුව එදිනට ශේෂය රු.2,822,609,574 ක් | දත්ත ඇතුළත් කිරීමේ දී සිදු වී ඇති තාක්ෂණික දෝෂයක් හේතුවෙන් නොසැසඳීම ඇති වී ඇති බවත් අදාළ ආයතන සමඟ සම්බන්ධ වී නිවැරදි කිරීමේ කටයුතු සිදු කරමින් | භාණ්ඩාගාරය සමග සසඳා නිවැරදි ශේෂ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වූයෙන් දේපළ, පිරියත හා උපකරණ ශේෂයේ රු.375,101,404 ක වෙනසක් නිරීක්ෂණය විය. | පවතින බව දන්වා තිබුණි. | |
| (ii) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත්වල දේපළ පිරියත හා උපකරණ ආරම්භක ශේෂයට එකතුව රු.26,583,165 ක අගයක් සමාලෝචිත වර්ෂයේ දී ඇතුළත් කර ගලපා තිබුණ ද ඊට අදාළ උපලේඛණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව පවතින බවත් ඉදිරියේ දී ඒවා ගෙන්වා ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | ආරම්භක ශේෂ ගැලපීමට අදාළ සටහන් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කළ යුතු අතර උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගෙවීම් වවුචර් පරික්ෂාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 කට අදාළ විගණනයට ඉදිරිපත් නොවූ එකතුව රු.15,179,011 ක් වටිනා ගෙවීම් වවුචර් 47 ක් පැවතුණි. එම හිඟ වවුචර් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 272 ප්‍රකාරව කටයුතු කර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක iv තුල අස්ථාන ගත වවුචර් පිළිබඳ ප්‍රකාශයේ හිඟ වවුචර් සම්බන්ධ තොරතුරු අනාවරණය කිරීමට ද ගණන්දීමේ නිලධාරී කටයුතු කර නොතිබුණි. | විගණනයට ඉදිරිපත් නොවූ මෙම වවුචර් අතරින් එක් වවුචරයක් හැර ඉතිරි වවුචර් මේවන විට ප්‍රාදේශීය කාර්යාලවල ඇති බවත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අස්ථාන ගත වූ වවුචර් පැවති බව දන්වා ඒවා නොමැති බව වාර්තා කර තිබුණි | අස්ථාන ගත වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතු අතර මුදල් රෙගුලාසි 272 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණ බව නියැදි විගණන පරික්ෂාවේ දී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය විධිමත් පරිදි පවත්වා නොතිබුණි. | ලේඛන අඩුපාඩු සම්පූර්ණ කර නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි 110 විධිවිධාන ප්‍රකාරව හා ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය පවත්වා ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනය යාවත්කාලිනකර නොතිබුණි. | ලේඛන අඩුපාඩු සම්පූර්ණ කර නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන හා පුනරාවර්තන වැය විෂයන් 17 ක් සඳහා ලබා දී තිබුණ එකතුව රු.1,404,394,700 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,126,961,678 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර ඉතිරි වීම් රු. 277,433,022 ක් විය. එම ඉතිරි වීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 96 ක් දක්වා වූ පරාසයක විය. | කොරෝනා වසංගත තත්ත්වය මත වියදම් සීමා වීම, අතැති බිල් පත් පැවතීම, ප්‍රතිපාදන පවරා දී ඇති බව හා අරපිරි මැස්මෙන් වියදම් දැරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | නිවැරදි ඇස්තමේන්තුකරණය හා ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය සිදු කළ යුතුය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් වර්ෂය තුල දී අදාළ පාර්ශවයන්ට ගෙවීම් සිදු කර නොමැති ගනුදෙනු බැරකම් ලෙස හඳුනාගත යුතු වුවද, නියැදි විගණන පරීක්ෂාවේ දී එම කොන්දේසිය සපුරා නොමැති ව්‍යාපෘති 18 ට අදාළ රු.44,546,313 ක් බැරකම් ලෙස හඳුනා ගෙන තිබුණි. | බිල්පත් ඉදිරිපත් කිරීමේ ප්‍රමාද වීම මත වවුචර් පිළියෙල කිරීම ප්‍රමාද වීම, කොන්ත්‍රාත් ගෙවීම් වවුචර් මිණුම් කටයුතු සිදු කිරීම හා අඩුපාඩු පරීක්ෂා කිරීම සඳහා ඉංජිනේරු අංශය වෙත ලබා දී තිබීම හා වවුචර්වල අඩුපාඩු පැවතීම වැනි හේතු ඉදිරිපත් කර තිබුණි. | බැරකම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට එක වැය විෂයක ගෙවිය යුතු වටිනාකම රු.54,909,418 ක් වුව ද ඒ සඳහා 2022 වර්ෂයේ ප්‍රතිපාදන සලසා තිබුණේ රු.29,200,000 ක් විය. ඒ අනුව, ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා නොතිබුණි. තවද එක් වැය විෂයක ගෙවිය යුතු රු.30,475,499 ක් වූ අතර ඒ සඳහා 2022 වර්ෂයේ රු.50,000,000 ක් වෙන්කර තිබුණ ද එය කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීමට වෙන්කළ මුදලක් විය. ඒ අනුව, බැරකම් පියවීමට ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ අක්මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම මත 2022 වර්ෂයට අතැති බිල්පත් ඇති වූ බවත් අතැති බිල් පත් පියවීම සඳහා 2022 වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව පිළිගන්නා බවත් දන්වා තිබුණි. | කාලීන, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ අවධානයෙන් යුතුව බැරකම් හා බැඳීම් ඇතිකර ගත යුතු බව හා එසේ කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව, කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය පාලනය හා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගෙන යාම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇති බවත් ඉදිරියේ දී තවදුරටත් වැඩි දියුණු කළ යුතු පද්ධතීන් හඳුනාගෙන අභ්‍යන්තර පාලන ක්‍රමවේද අළුතින් හඳුන්වා දීම සටහන් කර ගත් බවත් දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලට අනුකූලව අදාල සමාලෝචයන් සිදු කර විගණකාධිපතිවරයා වෙත වාර්තා කළ යුතුය. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | ප්‍රාදේශීය කාර්යාල වලින් තොරතුරු ලබා ගැනීමේ ප්‍රමාදය මත විමසුම් සඳහා පිළිතුරු ලබා දීම ප්‍රමාද වී ඇති බවත් එය වලක්වා ගැනීමට පියවර ගන්නා බවත් දන්වා ඇත. | විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබාදිය යුතුය. |

**2.4 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| i | XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය | වර්ෂ 3 කට හා 4 කට පෙර මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.355,133 ක ණය ශේෂය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මරණ පාරිතෝෂිකය මේ දක්වා නොගෙවීම මත එක් ණය ශේෂයක් අය වී නොමැති බවත් අනෙක් ණය ශේෂය මාසික වාරික වශයෙන් අයවන බවත් දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කර ණය ශේෂ කඩිනමින් නිරවුල් කරගත යුතුය. |
| ii | XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 | වැඩ තහනම් කරන ලද නිලධාරීන් දෙනෙකුගෙන් හා මියගිය නිලධාරීන් 3 ගෙන්ද අය විය යුතු එකතුව රු.730,075 ක ණය ශේෂයක් විය. | මෙම ණය ශේෂ අය කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතිණ බව දන්වා ඇත. | -එම- |
| iii | XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති | තනතුර හැරගිය නිලධාරීන් තිදෙනෙකුගේ එකතුව රු.356,647 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් පරිදි ණය කපා හැරීමට, ඇපකරුගෙන් අය කර ගැනීමට හා ණය ගෙවන ලෙස ලිපි මඟින් දැනුම් දීම වැනි පියවර ගෙන ඇති බව දන්වා තිබුණි. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සමාජ සේවා, සුභ සාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2015 අප්‍රේල් 27 දිනැති අංක 01/03/2015/NSPD හා 2019 ජුනි 24 දිනැති අංක 01/03/2015/NSPD(II) දරන චක්‍රලේඛ | අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයින් සඳහා ජීවනාධාර දීමනා හිමිකම් ලබා දීමේ දී හා ගෙවීම් කිරීමේ දී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොමැති අවස්ථා පැවතුණි. | මේ සම්බන්ධයෙන් උපදෙස් ලිපියක් 2022 මාර්තු 28 දින නිකුත් කර ඇති බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එසේ නොකල නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2001 දෙසැම්බර් 20 දිනැති 13/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක පැවති තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනු 89 ක චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සියළුම තොරතුරු ඇතුළත් කර නොතිබුණි | චක්‍රලේඛයේ දැක්වෙන සියළු තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවය මත මෙවැනි ගොනු පවතින බවත් මේ සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂාවක් සිදු කිරීමට ග්‍රාම නිලධාරීන් වෙන දැනුම් දී ඇති බවත් දන්වා ඇත. | -එම- |
| (ඈ) | 2019 මැයි 31 දිනැති අංක 14/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක විශ්‍රාම වැටුප් ලිපි ගොනු 1362 ක් චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් සංශෝධනය කර නොතිබුණි. | ඇතුම් ගොනුවල පවතින තත්ත්වය මත සංශෝධන සිදු නොවන බවත් විශ්‍රාම වැටුප් ලිපි ගොනුවල පවතින අඩුපාඩු මත සංශෝධනය නොවූ විශ්‍රාම වැටුප් ගොනු යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දී ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 1996 අංක 22 දරන පනත මගින් සංශෝධනය කරන ලද 1916 අංක 33 දරන (182 අධිකාරිය වන) තුවක්කු ආඥා පනත හා 2020 අගෝස්තු 26 දිනැති අංක 06/2020 දරන ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛය | | | |
| Ii. | පනතේ 5(1), 22(1), 22(2)(උ), 23(1) හා 23(3) වගන්ති හා චක්‍රලේඛයේ 2.4 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව බලපත්‍ර අලුත් කිරීමකින් තොරව කළුතර හා මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිවෙලින් ගිනි අවි 23 ක් හා 8 ක් පුද්ගලයන් විසින් සන්තකයේ තබා ගෙන තිබුණි. ඒවා අතරින් කළුතර ප්‍රා.ලේ.කා. ගිනි අවි 12 ක් වසර 17 කින් ද මතුගම ප්‍රා.ලේ.කා. ගිනි අවි 3 ක් වසර 05 කින් ද බලපත්‍ර අළුත් කළ බවට සාක්ෂි නොවුණි. | මෙම ක්‍රමවේදය නිවැරදි කිරීමට පියවර ගන්නා බව දන්වා ඇත | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ii | පනතේ 22(2)(ඇ) හා චක්‍රලේඛයේ 6 ඡේදය | කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ මියගිය පුද්ගලයින් 3 දෙනෙකුට අදාළ ගිනි අවි 3ක් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවත්නා අඩුපාඩු හඳුනා ගෙන ඇති බවත් ඉදිරියේ දී අඩුපාඩු මගහරවා ගැනීමට නිලධාරීන් දැනුවත් කළ බවත් දන්වා ඇත. | -එම- |

**2.5 අවිධිමත් ගණුදෙනු**

---------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | --------------------------- | --------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ව්‍යාපෘති 7 ක ඉදිකිරීම් නිමකර මැනුම්පත් සකසා වවුචර් පිළියෙල කර නොතිබුණ අතර කොන්ත්‍රාත්කරුට ගෙවිය හැකි මුදල දළ වශයෙන් ගණනය කර රු.6,320,000 ක් ලෙස දිස්ත්‍රික් ඉංජිනේරුවරයා හා කාර්මික නිලධාරී නිර්දේශ ලබා දී තිබුණි. තවද මෙම ව්‍යාපෘතිවලට අදාළ ගෙවිය යුතු මුදල රු.12,900,466 ක් ලෙස භාණ්ඩාගාරයට වාර්තා කර තිබුණි. | ඉදිකිරීම් කර්මාන්තයේ පැවති අර්බුද හේතුවෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට බාධා පැවතීම බිල්පත් ඉදිරිපත් කිරීමේ ප්‍රමාද වීම මත වවුචර් පිළියෙල කිරීම ප්‍රමාද වීම, කොන්ත්‍රාත් ගෙවීම් වවුචර් මිණුම් කටයුතු සිදු කිරීම හා අඩුපාඩු පරීක්ෂා කිරීම සඳහා ඉංජිනේරු අංශය වෙත ලබා දී තිබීම හා වවුචර්වල | අවිධිමත් ගණුදෙනු අනුමත කළ, නිර්දේශ කළ හා සහතික කළ නිලධාරින් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ පවත්වා විනයානුකූල පියවර ගැනීමත් රාජ්‍ය මුදල් අවභාවිතයක් වී ඇතිනම් ඒවා |

| | | | |
|---|---|---|---|
| | | අඩුපාඩු පැවතීම වැනි හේතු ඉදිරිපත් කර තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ workstation සකස් කිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කිරීම කර නොතිබිය දී හා රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය හා මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය සඳහා ජෙනරේටරයක් සපයා සවිකිරීමේ ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම් විසින් අවලංගු කර තිබිය දී එම ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් ලෙස පිළිවෙලින් රු.5,000,000 ක්, රු.4,878,865 ක් හා රු.3,602,880 ක අතැති බිල්පත් ගෙවීමට පවතින බව භාණ්ඩාගාරයට වාර්තා කර තිබුණි. | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීමට අදාළව ප්‍රමුඛ ස්ථානය දුන් කටයුත්තක් බව දන්වා ඇත. අනෙකුත් ව්‍යාපෘති 2 ක්‍රියාත්මක කිරීම අවලංගු කර ඇති බව වාර්තා කර ඇත. | -එම- |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැසේජ ටයිල් කිරීමට අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවීමට රු.4,810,840 ක අතැති බිල්පත් ගෙවීමට පවතින බව භාණ්ඩාගාරයට වාර්තා කර තිබුණ ද 2022 මාර්තු 28 දක්වාත් ටයිල් ඇල්ලීම සිදු කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | නිලධාරීන්ගේ කාර්ය බහුලතාවය මත අතපසු වීමකින් අතැති බිල් පත් වාර්තාවට මෙම අයිතමය ඇතුළත් වී ඇති බව දන්වා ඇත. | -එම- |

**2.6** **මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේ දී සමාලෝචිත වර්ෂයේ ගෙවීම් ආරම්භ කර ඇති ආබාධ සහිත ප්‍රතිලාභීන් නමදෙනෙකුට දීමනා ගෙවීමේ දී මුදල් ලබාගත් බවට අත්සන් ලබාගෙන එකතුව රු.320,000 ක මුදලක් නොගෙවා නිලධාරින් විසින් එම මුදල් අවභාවිතා කර තිබුණ බව නිරීක්ෂණය විය. | මෙම මූල්‍ය අක්‍රමිකතාවය පිළිබඳ මූලික විමර්ශනයක් කිරීමට කමිටුවක් පත් කර ඇති අතර ඊට සම්බන්ධ නිලධාරීන්ට මේවන විටත් ස්ථාන මාරු ලබා දී ඇති බවත් වාර්තා කර ඇත. | අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු බව හා මුදල් අවභාවිතා කළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු වී ඇති රු.7,022,668ක විශ්‍රාම වැටුප් වංචාවක් අනාවරණය කර ගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2021 මැයි 01 දින මූලික විමර්ශනයක් පවත්වා තිබුණ ද මෙම විශ්‍රාම වැටුප් වංචාව පිළිබඳ තොරතුරු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් වංචාව පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළි දරව් කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බව වාර්තා කර ඇත. | -එම- |

## 2.7 තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු තැන්පත් ගිණුම් 6 ක එකතුව රු.467,133,878 ක් වූ අතර ඉන් රු.166,946,673 ක් වර්ෂ 2 ක් ද රු.17,891,238 වර්ෂ 5 ක් ඉක්ම වූ තැන්පතු ශේෂ විය.. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම, බාහිර ආයතනවලින් ලැබිය යුතු නිර්දේශ ප්‍රමාදවීම හා ව්‍යාපෘතිවල නිවැරදි නොකළ දෝෂ හා අඩුපාඩු නිවැරදි කිරීම ප්‍රමාද වීම වැනි හේතු මත තැන්පත් මුදල් නිරවුල් කිරීම ප්‍රමාද වී ඇති බවත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට නිලධාරීන් දැනුවත් කළ බවත් වාර්තා කර ඇත. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 දැක්ම හා මෙහෙවර

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| එළදායී සම්පත් කළමනාකරණයක් තුළින් කාර්යක්ෂම පරිපාලන ව්‍යුහයක් බිහිකර දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනයක් ඇති කිරීම කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙවර ප්‍රකාශය ලෙස දක්වා තිබුණ ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 8 ක රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලට අයිති ගොඩනැගිලි 45 ක් වර්ෂ ගණනාවක සිට දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා පරිහරණයට ගැනීමට කටයුතු කිරීමෙන් තොරව අභාවිතව පැවතුණි. ඉන් ගොඩනැගිලි 11 ක් භාවිතා කිරිමට නොහැකි තත්ත්වයේ පැවතුණි. තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් විසින් අදාළ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පවතින රාජකාරි බහුලතාවය මත වුවද ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් වත්කම් උපයෝජනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුව ද අර්ධ රාජ්‍ය ආයතන මේ සම්බන්ධ දක්වන ක්‍රියාමාර්ග මත මෙම වත්කම් මෙතෙක් අභාවිතව පවතින බව දන්වා ඇත. | දිස්ත්‍රික්කයේ සම්පත් සංවර්ධන කටයුතු සඳහා පූර්ණ ලෙස යොදාගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක කිරීමට අනුමත එකතුව රු.1,165,786,760 ක් වූ ව්‍යාපෘති 1416 ක් අතරින් ව්‍යාපෘති 904 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණ අතර එකතුව රු.660,145,918 ක් වටිනා ව්‍යාපෘති 511 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවිධිමත් වැඩ පිළිවෙල, ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ඉදිරිපත් නොවීම, 2021 වර්ෂයේ අග භාගයේ දී බොහෝමයක් ව්‍යාපෘති අනුමත කිරීම, රට පුරා අමුද්‍රව්‍ය මිල වේගයෙන් ඉහල යාම හා කොන්ත්‍රාත් කරුවන් වෙත ගෙවීම් ප්‍රමාද වීම මත ඔවුන් මන්දගාමී වීම වැනි හේතු මේ සඳහා බලපා ඇති බව වාර්තා කර ඇත. | අදාළ අමාත්‍යාංශ හා පාලන අධිකාරීන් සමඟ සාකච්ඡා කර දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ව්‍යාපෘති අනුමත කර ගැනීම හා ඒවා විධිමත් ව ක්‍රියාවට නැංවීමට කටයුතු සම්පාදනය කර ගත යුතුය. |

## 3.3 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ දෙවන මහල පුලුල් කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ පහත කරුණු නිරීක්ෂණය විය.<br><br>i. ඇස්තමේන්තු සකස් කිරීමේ දී එකතුව රු.960,520 ක වැඩ විෂයයන් 3 ක් සඳහා දිස්ත්‍රික් ඉංජිනේරු සකස් කළ විශේෂ මිල රේට විගණනයට ඉදිරිපත් කර නොතිබුණ අතර වැඩ විෂයය නිර්වචනය අපැහැදිලි වීම.<br><br>ii. ගිවිසුම් ප්‍රකාරව කර්මාන්තය දින 35 නික් නිම කළ යුතු වුවද ඒ සඳහා Work Programme ලබා ගෙන | ගොඩනැගිල්ලේ ඉදිරි පැවැත්ම සලකා බලා නව ඉදිකිරීම් කඩිනමින් ආරම්භ කළ බවත් අමුද්‍රව්‍ය හිඟ වීම, මිල උච්චාවචනය හේතුවෙන් යම් ප්‍රමාදයක් සිදු වූ බවත් 2022 ජුනි 2 දින වන විට ඉදිකිරීම් සාර්ථකව නිම කර ඇති බවත් වාර්තා කර තිබුණි. | අපැහැදිලි රේට හා සාවද්‍ය තොරතුරු ඇතුලත් ලේඛන මත ගෙවීම් කිරීමට අදාල අනුමැතිය, නිර්දේශය හා සහතික කළ සියළු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අදාල පරිදි විනයානුකූල පියවර ගතයුතු බව හා වැඩිපුර ගෙවා ඇති මුදල් අයකරගත යුතු බව |

| | | |
|---|---|---|
| නොතිබීම, රු.350,400 ක ප්‍රමාද ගාස්තුවක් අය විය යුතු වීම හා රු.282,701 ක් වූ කාර්ය සාධන බැඳුම් කරයේ කාලය දීර්ඝ කරවා ගෙන නොතිබීම.<br><br>iii. 2021 දෙසැම්බර් 31 දිනට කර්මාන්තයේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 50කට වඩා අඩු මට්ටමක පැවතියදීත් සියයට 100 ක කර්මාන්තයේ වැඩ නිම කළ බවට දක්වමින් රු.6,716,962 ක වවුචර් පිළියෙල කර 2021 දෙසැම්බර් 31 දින රු.2,000,025 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු අතර ඉතිරි රු.4,716,937 ගෙවීම සඳහා තවත් වවුචරයක් පිළියෙල කර එය ගෙවිය යුතු බිල් ලෙස භාණ්ඩාගාරයට වාර්තා කර තිබීම. | | |
| (ආ) 2021 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරිමට සමගාමීව සෞභාග්‍යා නිෂ්පදන ගම්මාන පිහිටුවීම හා එම ගම්මාන වල පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරිම යටතේ මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ක්‍රියාත්මක කල වැඩසටහනට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.<br>i. ව්‍යාපෘති මාර්ගෝපදේශ වලට අනුව, ලියාපදිංචි නොවූ සමිතියක් වෙත විධිමත් අකෘතියේ ගිවිසුමට එළඹීමෙන් තොරව රු.3,428,000 ක කෘෂි උපකරණ ලබා දී තිබීම හා ඒවා ලබා දීමේ දී අදාළ තාක්ෂණික ආයතනවල උපදෙස් ලබාගෙන නොතිබීම.<br>ii. කැඳවන ලද මිල ගණන් අනුව, එකක් රු.14,000 මිල යටතේ වගා පොලිතින් රෝල් 20 ක් මිල දී ගැනීමට තාක්ෂණ කමිටු ව විසින් නිර්දේශ කර තිබුණ ද ප්‍රදේශීය ලේකම් විසින් පොලිතින් රෝල් 52 ක් මිලදී ගෙන සමිතියට ලබා දී තිබුණ අතර 2022 මාර්තු 16 දින සිදු කළ විගණන ක්ෂේත්‍ර පරික්ෂාවේ දී පොලිතින් රෝල් 22 ක් භාවිතයට ගෙන නොතිබීම. | ප්‍රාදේශීය කාර්යාල වෙතින් පිළිතුරු ලබා ගත යුතු බැවින් පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව වාර්තා කර ඇත. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ මාර්ගෝපදේශ අනුව කටයුතු කළයුතු බව හා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී එසේ කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරික්ෂණයක් පවත්වා විනයානුකූල පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දහම් පාසැල් සඳහා උපකරණ සැපයීම වෙනුවෙන් බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව නමින් රු.200,000 ක චෙක්පතක් නිකුත් කර තිබුණ ද 2022 අප්‍රේල් 30 දින වන විටත් අදාල භාණ්ඩ සැපයීම සිදුකර නොතිබුණි. චෙක්පත විෂයභාර සංවර්ධන නිලධාරී භාරයේ රඳවාගෙන තිබුණි. | -එම- | භාණ්ඩ හා සේවා ලැබීමෙන් තොරව වවුචර් පිළියෙල කර චෙක්පත් ලිවීමට කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු අතර ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වලක්වා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | සෞභාග්‍යා ව්‍යාපෘතිය යටතේ ඇලමුණදෙනිය සිට ශාන්ත පීතර වත්ත දක්වා මාර්ගය තාර දමා සංවර්ධන කිරීමේ ව්‍යාපෘතියේ ABC ගල් සැපයීම හා 37.5mm, 19mm, 12.5mm ගල් සැපයීමේදී වැඩිපුර මිල ගණන් බිල්පතට ඇතුලත් කිරීම මත රු.487,500 ක් ද, ඒවා ගොනු නොකර ගොනු කිරීම සඳහා රු.71,409 ක් ද, පළමුවර තාර යෙදීමේදී වැලි වෙනුවට චිප්ගල් භාවිතා කිරීම නිසා රු.58,623 ක් ද සංවර්ධනය කිරීමට ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකට තාර ඇතිරීම කළ බවට රු.192,239 ක් ද වශයෙන් එකතුව රු.809,771 ක් වැඩිපුර ගෙවා තිබුණි බව නිරීක්ෂණය විය. | -එම- | විධිමත් පරීක්ෂණයක් පවත්වා වැඩිපුර ගෙවා ඇති මුදල් රජයට අය කරගත යුතු බව හා ඊට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතු බව |
| (ඉ) | සමෘද්ධි සහනාධාරලාභී පවුල් සවිබලගැන්වීම උදෙසා ක්‍රියාත්මක කළ සමෘද්ධි ගෙවතු වගා වැඩසටහනට අදාළව තෝරාගත් ප්‍රතිලාභීන් 40 දෙනෙකු සඳහා කිකිළි පැටව් 394ක් ලබාදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.224,580 ක මුදලක් වැයකර තිබුණ ද එය ඵලදායීව පවත්වාගෙන යාම සඳහා ඉවහල් වන බෙහෙත්, ආහාර ලබාගනීමේ ක්‍රමයන් ගැමි ජනතාව වෙත හඳුන්වාදීමේ ක්‍රමවේදයන් සකසා නොතිබීම හා පැටවුන්ගෙන් 9:1 අනුපාතයට කිකිළි පැටවුන් නොසිටීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | -එම- | විධිමත් අධීක්ෂණයකට ලක්කර පවතින අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බව |

| | | | |
|---|---|---|---|
| (ඊ) | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු3,008,250 ක මුදලක් වැය කර තෝරාගත් සමෘද්ධි ප්‍රතිලාභී පවුල්ට 73 ක් සඳහා තේ පැළ 143,250 ක් බෙදාහැරීමේ ව්‍යාපෘතියක් 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණ ද 2022 මාර්තු 14 දිනට විට විගණනයට ඉදිරිපත් කළ ප්‍රගති වාර්තා අනුව බෙදාහැර ඇති තේ පැල අතරින් තේ පැල 80,980 ක් වගා කර නොතිබීමත් වගාකළ තේ පැල 3,467 ක් මිය යාමත් වැනි කරුණු හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | -එම- | විධිමත් පරීක්ෂණයක් පවත්වා වගා නොකළ තේ පැළ සඳහා දරා ඇති වියදම් වගකිව යුතු පාර්ශවවලින් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව හා වගාකළ තේ පැල තිරසාරව පවත්වා ගෙන යාම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් හඳුන්වා දීමට පියවර ගත යුතුය. |

**3.4 පාඩු හා හානි**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------------ | --------------------------- |
| (අ) | දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 1989 වර්ෂයේ දී ගිනිතබා විනාශ කිරීමෙන් සිදු වී ඇති රු.1,465,525 ක අලාභය මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයතු කර අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරිමට 2021 දෙසැම්බර් 31 දක්වාත් කටයුතු කර නොතිබුණි. | අදාළ අලාභ හානිය පොත්වලින් කපා හැරීම සඳහා මු.රෙ.109 අයදුම් පත්‍රය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර පාඩු හානි කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ්රථයක් අනතුරට පත්වී තිබුණ ද ඒ සම්බන්ධ අලාභය පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දින වන විට අලාභය තක්සේරු කර ඉදිරිපත් කර නොතිබුණ බව වාර්තා කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනමින් පරීක්ෂණ පවත්වා අලාභය හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මිය ගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව යාවත්කාලීන නොකිරීම මත කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක මිය ගිය විශ්‍රාමිකයන් 25 ක් වෙනුවෙන් ගෙවා ඇති රු.764,551 ක අධි භාර මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් 2022 වර්ෂයේ දී අය කරමින් පවතින බවත්, ඇතැම් විශ්‍රාමිකයින්ගෙන් මුලු මුදලම අය වී ඇති බවත් වාර්තා කර ඇත. | අදාල වැඩිපුර ගෙවීම් අයකර ගැනීමටත් ඉදිරියේදී එවැනි තත්ත්වයන් ඇති නොවීමට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 24 ක් සඳහා 2022 මැයි 31 දිනටත් පිළිතුරු එවා නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් ආයතන මඟින් පිළිතුරු ලැබුණ පසු ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | විගණන විමසුම් සඳහා කාලීනව පිළිතුරු ලබාදී අදාල නිවැරදි කිරීම් කළ යුතුය. |

**3.6 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කළුතර දිස්ත්‍රික්කය තුළ ස්වභාවික ආපදා වලින් පූර්ණ හානියට පත් වන සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් නිසා ඉවත් කලයුතු ලෙස හඳුනාගත් පවුල් සඳහා ''නිවසට නිවසක්'' සංකල්පය මත නිවාස 918 ක් තැනීමට 2017 වර්ෂයේ සිට 2021 දක්වා ලැබී ඇති රු.1,466,813,225 ක ප්‍රතිපාදන අතරින් 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන් හට ඉන් රු.1,002,291,323 ලබා දී තිබුණි. ප්‍රතිලාභීන් ලවා නිවාස 397 ක් නිම කරවා ගැනීමට නිලධාරීන් අපොහොසත් වී තිබුණ බව නිරීක්ෂණය විය. | අවධානම් නිවාස කඩා ඉවත් කිරීමට අකමැත්තෙන් අවසන් වාරිකය ලබා නොගැනීම, වාරික ලබා ගත් පසු අදාළ ඉදිකිරීම් කිරීමට කල් ගත කිරීම, ස්වභාවික ආපදා හා කොවිඩ් තත්ත්වය මත ඉදිකිරීම් පසු බෑමට ලක් වීම හා ලබා දුන් ප්‍රතිපාදන වලට සාපේක්ෂව අක්මුදල් ලබා දීමේ ඌනතා වැනි කරුණු හා තවත් ප්‍රායෝගික කරුණු හේතුවෙන් ඉදිකිරීම් නිම කිරීම ප්‍රමාද වී ඇති බව වාර්තා කර තිබුණි. | මුදල් ලබාදුන් ප්‍රතිලාභීන් ගේ නිවාස නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු අතර පවතින ගැටලුවලට විසඳුම් ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගිනි අවි බලපත්‍ර අළුත් කිරීමේදී අදාළ පාර්ශව වෙත ගිනි අවි අවශ්‍යතාවය තවදුරටත් පවතින බව නිලධාරීන් විසින් තහවුරු කර ගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර නුසුදුසු පුද්ගලයින් අත තුවක්කු ගැවසීම තුලින් වනසතුන්ට හා සිවිල් ජන ජීවිතයට බලවත් තර්ජන එල්ලවිය හැකි බැවින් සහ ගිනි අවි අගති සහගතව පරිහරණය කිරීම වැලැක්වීම සඳහා නියමිත කාලසීමාව තුළ ගිනි අවි බලපත්‍ර අළුත් නොකරන බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම දිස්ත්‍රික් ලේකම් හා කොට්ඨාශ භාර පොලිස් අධිකාරීන්ගේ වගකීම වුව ද | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් බලපත්‍ර අළුත් කිරීමේ කාලය වරින් වර දීර්ඝ කිරීම, හිඟ ගාස්තු අය කර ගැනීමට බලපත්‍ර ලාභීන් දැනුවත් කර ඇති බව අනවසර ගිනි අවි රැස් කිරීමට පොලීසිය දැනුවත් කර ඇති බව හා ඉදිරියේ දී අදල අංශ සමඟ නිසි සම්බන්ධීකරණයකින් | අදාළ අංශ සමඟ සම්බන්ධ වී විධිමත් සමීක්ෂණයක් සිදු කර තවදුරටත් ගිනි අවි සන්තකයේ තබා ගැනීමේ අවශ්‍යතාවය සොයා බැලීම හා ගිනිඅවි බලපත්‍ර අළුත් නොකරන පුද්ගලයන් |

| | | | |
|---|---|---|---|
| | එම ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් බලපත්‍ර අළුත් නොකළ ගිනි අවි 31 ක් සඳහා ප්‍රමාණවත් නෛතික ක්‍රියාමාර්ග ගෙන නොමැති බව කළුතර හා මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිදුකළ නියැදි පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | කටයුතු කරන බව දන්වා තිබුණි. | සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගත යුතුය. |
| (ඇ) | කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 තුළ 2021 ජනවාරි 01 දිනට අනවසරයෙන් අල්ලාගෙන තිබූ ඉඩම් කට්ටි සංඛ්‍යාව 6,893 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඉඩම් කච්චේරි 262 පවත්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විසින් ඉඩම් කට්ටි 1,738 ක් පමණක් නියමානුකූල කර තිබුණි. මිල්ලනිය, හොරණ හා පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් කැබලි 309 ක් නියමානුකූල කිරීම ආරම්භ කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී ඉඩම් කැබලි කිසිවක් නියමානුකූල කර නොතිබුණි. | ප්‍රාදේශීය කාර්යාල වෙතින් පිළිතුරු ලබා ගත යුතු බැවින් පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව වාර්තා කර ඇත. | අනවසර ඉඩම් නියමානුකූල කිරීම කඩිනමින් කළ යුතුය. |
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක විශ්‍රාමිකයන් 34 දෙනෙකු සඳහා ස්ථිර හෝ තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනුවක් නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවමින් පවතින බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේ දී පමණක් එකතුව රු.30,829,185 ක මුදලක් එසේ ගෙවා තිබුණි. ඒ අනුව, ස්ථිර හෝ තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනු නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවීමේ දී වැරදි, වංචා හෝ අක්‍රමිකතා සිදු වීම වලක්වා ගැනීමට අනුගමනය කළ යුතු විධිමත් ක්‍රමවේද හඳුන්වා දීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | ස්ථිර හෝ තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනු නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවීමේ දී සිදු විය හැකි වැරදි, වංචා හා අක්‍රමිකතා වලක්වා ගැනීමට 2017 අගෝස්තු 03 දින උපදෙස් ලිපියක් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යවා ඇත. | ගොනු නොමැති විශ්‍රාමිකයින් සම්බන්ධයෙන් විමර්ශනය කර විශ්‍රාම වැටුපේ හිමිකම තහවුරු කරගත යුතු අතර හා ස්ථිර හෝ තාවකාලික ගොනු සැකසිය යුතුය. |
| (ඉ) | කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක විශ්‍රාම ලිපිගොනු 165 ක 2021 දෙසැම්බර් 31 දිනට වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල රු.13,294,964 ක් වන අතර ඒවා වාරික වශයෙන් අය කර ගනිමින් පැවති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක විශ්‍රාමිකයන් 15 දෙනෙකු මියයාම හේතුවෙන් රු.962,672 ක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | අය නොවී පවතින මුදල් අය කර ගැනීම සඳහා ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බැලීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර ඇත. | වැඩිපුර ගෙවීම විධිමත් පරිදි අයකර ගැනීමටත් කටයුතු කළ යුතු කළ යුතු වේ. |
| (ඊ) | කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුලර්ටන් කර්මාන්තපුරය දිගුකාලීන බදු පදනම මත ඉඩම් ලබා දී ඇති ආයතන 20 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් බදුකර හෝ බදු අනුමත ලිපි නිකුත් කර නොතිබුණි. ජනපද නිලධාරී විසින් ඉඩමේ දළ තක්සේරු මත ගණනය කිරීම අනුව, බදුකරුවන් 20 දෙනාගෙන් වර්ෂ 2006 - 2022 දක්වා කාල සීමාවට අදාළ රු.48,283,020 ක බදු මුදලක් අයකර ගැනීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය විය. භුක්තිය | දළ තක්සේරුව මත බදු මුදල් අය කිරීමට ඉඩම් කොමසාරිස් ගෙන් විමසීම් කර ඇති බවත් ලැබෙන උපදෙස් පරිදි ඉදිරි කටයුතු කරන බව වාර්තා කර ඇත. | ඉඩම්වල භුක්තිය පවරා හිඟ බදු අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතු අතර මේ දක්වා නිසි ක්‍රියාමාර්ග නොගත් නිලධාරීන් සම්බන්ධව විනය |

| | | | |
|---|---|---|---|
| | පවරා දී ඇති ඉඩම් සඳහා දළ තක්සේරුව මත බදු මුදල් අය කිරීමට 2021 ඔක්තෝබර් 13 දිනැති අංක 2021/06 දරන චක්‍රලේඛය මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ප්‍රදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබා දී තිබුණි. එහෙත් කළුතර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඉඩම් බුක්තිය පැවරීමට අදාළ කටයුතු නිම කර නොතිබීමෙන් ඉහත බදු ආදායම රජයට අහිමිවී තිබුණි. තවද, මතුගම පල්ලෙගොඩවත්ත කර්මාන්ත පුරයේ ඉඩම් 5 කින් හා අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෘෂිකාර්මික හා කාර්මික පදනමින් දිගුකාලීන බදු පදනමට ලබා දුන් ඉඩම් 5 කින් බදු අය නොකරන අතර එම ඉඩම්වල භුක්තිය පවරා දළ තක්සේරු මත බදු මුදල අය කිරීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි. | | ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (උ) | කළුතර හා අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 2 2 හි අනවසර රජයේ ඉඩම් කැබලි 416 ක් පැවතිය ද අනවසර පදිංචිකරුවන් 39 දෙනකුගේ පමණක් විස්තර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 2 හි හිස් ඉඩම් 124 ක් පවතින නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශය තුල හඳුනාගැනීමට අදාල තොරතුරු පවතිනුයේ හිස් ඉඩම් 114 ක පමණි | පිළිතුරු ලබා දී නොමැත | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශය තුල අවශ්‍ය විස්තරාත්මක තොරතුරු නිසි පරිදි නඩත්තු කළ යුතු අතර අනවසරකරුවන් නියමානුකූල කිරීම හෝ වෙනත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | 2020 වර්ෂයේ සිට ආරම්භ වූ කොරෝනා වසංගත තත්ත්වය, ඊට සමගාමීව රට තුල උද්ගත වූ ආර්ථික තත්ත්වය, රාජ්‍ය ආදායම පිරිහීම ආදි කරුණු හේතුවෙන් රාජ්‍ය වියදම් දැරීමේ දී ගණන්දීමේ නිලධාරීන් විසින් විචක්ෂණභාවයෙන් කටයුතු කළ යුතු වනවා මෙන්ම සෑම ගණු දෙනුවක්ම ආර්ථික, කාර්යක්ෂම හා ඵලදායී බවින් යුත්තව සිදු කළ යුතු විය. එහෙත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ දී කාලීන තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව කාර්යාල පරිශ්‍රයේ අත්‍යවශ්‍ය නොවූ අළුත්වැඩියා හා අලංකරණ කටයුතු වෙනුවෙන් එකතුව රු.17,611,828 ක වියදම් දැරීම හෝ ගෙවීම් සඳහා බැරකම් ඇති කර ගැනීමට කටයුතු කර තිබුණි. ශ්‍රවණාගාරයේ වහලය අළුත්වැඩියාව හැර අනෙකුත් සියළුම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවුවද මහජනතාව සඳහා බාධාවකින් තොරව සේවා සැපයීමේ හැකියාව පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | දීර්ඝ කාලයක සිට දෙවන මහලේ සිට පස්වන මහල දක්වා අළුත් වැඩියා කිරීමක් සිදු වී නොමැති බැවින් ලිපි ලේඛන වල ආරක්ෂාව හා මහජනතාවට ප්‍රියමනාප ස්ථානයක් බවට කාර්යාලය පත් කිරීමේ අරමුණින් මෙම අළුත්වැඩියාවන් සිදු කළ බව දන්වා ඇත. | අනාර්ථික වියදම් අනුමත කළ, නිර්දේශ කළ හා සහතික කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු බව හා ඉදිරියේදී වියදම් දැරීමේදී ආර්ථික කාර්යක්ෂම හා ඵලදායීතාවයෙන් යුතුව සිදුවන බව තහවුරු කිරීමේ පියවර ගැනීම |

**4 මහජනතාව වෙත සේවා ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් අමාත්‍යාංශයට හා විගණනයට ඉදිරිපත් කළ කාර්යසාධන ඉලක්ක සංඛ්‍යා එකිනෙකට වෙනස්වීම, ග්‍රාම නිලධාරි කාර්යාල පරික්ෂාව වැනි නිශ්චිත කාර්යයක් සඳහන් නොවූ දර්ශක තෝරාගැනීම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අධීක්ෂණ නිලධාරියා විගණනයට ලබා දුන් කාර්යසාධන දර්ශක අභ්‍යන්තර විගණක විසින් ලබා දුන් දර්ශක සමඟ නොසැඳීම වැනි කරුණු හේතුවෙන් කාර්යසාධනයේ තථ්‍ය ප්‍රගතිය මැන බැලීමට නොහැකි විය. | මහජනතාවට සෘජුවම සේවා සපයන රාජ්‍ය නිලධාරියා වන ග්‍රාම සේවා නිලධාරියාගේ කටයුතු වාර්ෂිකව ඇගයීම අතවශ්‍ය කරුණක් වූ බැවින් එය ඉලක්කයක් ලෙස හඳනා ගත් බවත් සංඛ්‍යා දත්තවල නොසැසඳීම නිලධාරීන්ගේ අතපසු වීමක් බවත් දන්වා තිබුණි. | මහජනතාවට වැඩි සේවාවක් ඉටුකළ හැකි නිවැරදි කාර්ය සාධක දර්ශක හඳුනාගත යුතු අතර අධීක්ෂණ නිලධාරීන් දැනුවත් කර ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 2 ආකෘතිය ප්‍රකාරව 2020 වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා පිළියෙල කළ මානව සම්පත් සැලැස්ම විගණනයට ඉදිරිපත් නොවීය. තවද, සේවක පුහුණු සැලැස්ම හා කාර්යමණ්ඩලය සඳහා කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | 2022 වර්ෂයට නිවැරදිව මානව සම්පත් සැලැස්මක් සකසන බව හා කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2.2 අනුව එකම සේවා ස්ථානයක වර්ෂ 05 කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් වන බව දක්වා තිබුණ ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට සේවා කාලය වසර 05 ඉක්ම වූ නිලධාරීන් 27 දෙනකු සේවය කරන බව නිරීක්ෂණය විය. | අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය මඟින් 2022 වර්ෂයේ දී නිලධාරීන් 9 දෙනෙකු ස්ථාන මාරු කර ඇති බව වාර්තා කර ඇත. | ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව මාරුවීම කළ යුතුය. |
| (ඇ) | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දින අතිරික්ත කාර්ය මණ්ඩලය 8 දෙනකු හා ඌන කාර්ය මණ්ඩලය 10 දෙනකු නිරීක්ෂණය විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ අවධානය යොමු කළ යුතුය. |